www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 2010 සමාජවාදී සමානතා පක්ෂයේ ඉදිරිදර්ශන සහ කර්තව්‍යයෝ

## Perspective and tasks of the Socialist Equality Party in 2010

ඩේවිඩ් නෝර්ත් සහ ජෝෂප් කිශෝර් විසිනි

2010 පෙබරවාරි 01

*පහත දැක්වෙන්නේ 2010 ජනවාරි 9 දින මිචිගන්හි ඈන් ආබර් නගරයේ දී පවත්වන ලද සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික සාමාජිකත්ව රැස්වීමකට ඉදිරිපත් කරන ලද වාර්තාවක සංශෝධිත වර්තනයයි.*

01. ලෝක ධනවාදය 21 වන සියවසේ දෙවන දශකයට ඇතුලුවන්නේ ගැඹුරුවන ආර්ථික සහ භූ දේශපාලනාත්මක අර්බුදයක් මැද්දේය. 2009 ජනවාරි මාසයේ දී, 2008 සැප්තැම්බර් මස ඇරඹුනු මූල්‍යමය ගිනියම්වීම ද සමග මෙම ආර්ථික අර්බුදය ඇමරිකානු ධනවාදයේ ගෝලීය තත්වයේ දිග්ගැස්සුනු පරිහානියේ සන්ධිස්ථානයක් සලකුනු කරන බව සමාජවාදී සමානතා පක්ෂය පැහැදිලි කලේ ය. සසප මෙසේ අනතුරු ඇඟවීය: ධනේශ්වර පදනම මත ආර්ථික පුනරුත්ථාපනය, "අත්පත් කර ගත හැක්කේ... කම්කරු පන්තියේ ජීවන තත්වයන් ව්‍යසනකාරී ලෙස පහත හෙළීමෙන් පමනකි...." අර්බුදයට "සාමාජික වශයෙන් අපක්ෂපාතී" විසඳුමක් තිබිය නොහැකි යයි ද ආර්ථික බිඳවැටීමට ඇමරිකානු පාලක පන්තිය යොදා ගන්නා ගොඩ වෙදකම්වලින් කිසිවක් විසඳෙනු නැතැයි" ද අපි අවධාරනය කලෙමු. බැරැක් ඔබාමා දිවුරුම් දෙද්දී අනතුරු හඟවා සිටි සසප "හෙතෙම ධනවාදයේ අත්තිවාරම්වලට ද මූල්‍ය ප්‍රභූවේ ආසක්තයන්ට ද අත නොතබන විසඳුමක් " අර්බුදය සඳහා සොයනු ඇතැයි පෙන්නුම් කලේය.

02. මෙම ඇගැයීම නිවැරදි බව දැන් ඔප්පු වී ඇත. අර්බුදයේ අති මූලික හේතුවලින් එකකට වත් පිලිතුරු දී නැත. 2008 සැප්තැම්බරයේ දී කඩාපාත්වූ ව්‍යසනයේ පරිමාව ද ඔබාමා පාලනාධිකාරයේ ප්‍රතිචාරයේ බෙලහීන ස්වභාවයද අතර පරතරය අතිශය බරපතල ය. ඇමරිකා එක්සත් ජනපදය තුල මිලියන ගනන් කම්කරුවන්ගේ ද ලෝක පරිමානව බිලියන ගනන් ජනතාවගේ ද ජීවිත විනාශභාග් කල සාපරාධී ඉවබව නැති සමපේක්ෂනය ඉදිරියේ ඔබාමා වෝල්වීදියේ ධනයට හා ආසක්තයන්ට හානි කර වූ කිසිදු ක්‍රියාවක් කලේ නැත. ඔබාමා පාලනාධිකාරයේ ප්‍රථම උත්සුකය වූයේ මූල්‍ය ප්‍රභූවේ ධනය ආරක්ෂා කර දෙන බවට ද වෝල් වීදියේ දූ කෙලියට "නිව් ඩීල්" සමයේ දී පනවන ලද වර්ගයේ සීමාවන් නම් යලිත් පනවන්නේ නැති බවට ද සහතික වීම ය. මහජනතාවට සහන දෙනවා වෙනුවට මූල්‍ය පද්ධතිය තුලට මුදල් කන්දරාවක් වගුරා ඇත. මෙය අපේක්ෂා කලයුතු පරිදි ම වෝල්වීදියේ සාහසික සමපේක්ෂනයේ නව වටයකට දොර හැර දුනි. කොටස් වටිනාකම් පිම්මේ නැග ධනවත් සමපේක්ෂකයන් තවත් පිම්බී ඇත්තේ වැඩ කරන ජනකායට අයත් අති මහත් බහුතරයේ ගොරතර දිළිඳුකම සමනය කිරීමට ආන්ඩුව කුමන පියවරක් හෝ නොගන්නා තතු තුල ය.

03. ලෝක වැඩ කරන ජනතාව මුහුන දී සිටින්නා වූ තතු භයංකරය. ඔවුන් ගෙන් සැලකියයුතු කොටසක් අතිමහත් දරිද්‍රතාවයේ ගැලී සිටිති. දෙලක්ෂයක් ජනයා මරනයට පත් කල හයිටියේ ජනවාරි 12 භූචලනය සකල ලෝකය ම කම්පා කලේ ය. එහෙත් හයිටියානු ජනයා විඳින දුකෙහි ඇති එකම සුවිශේෂී භාවය නම් එම ව්‍යසනයේ ක්ෂනික භාවය පමනි. ලොව පුරා අසංඛ්‍ය ජනකායක් දිනපතාම මන්දපෝෂනයෙන් රෝගවලින් සහ භූගෝල පරිමාන දුප්පත්කමේ නානාවිධ විපාකවලින් මියයමින් සිටිති. එපමනක් නොව හයිටියානු මහා ඛේදයේ කම්පාකාරී පරිමාවන් නිර්මානය කරනු ලැබ ඇත්තේ ශතවර්ෂයකට ආසන්න කාලයක් තිස්සේ ඇමරිකානු මහා සංගතයන් විසින් කරගෙන යන ලද්දා වූ මුර්ග සූරා කෑම මගිනි. දැන් ඇමරිකානු ආන්ඩුව මෙ මහා ව්‍යසනය යොදාගන්නේ තම යුද හමුදාව එහි යැවීමටත් හයිටියේ ආර්ථිකය ඇමරිකානු ධනවාදයේ ආසක්තයන්ට වඩාත් සෘජුව අනුකූලවන ලෙස සකසා ගැනීමටත් ය. එය හයිටියට නැතුව බැරි ආධාර වලක්වා අනාථයන් ඇමරිකාවට පලා ඒම නවත්වා ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස තවත් දහස් ගනනක් හයිටියානුවෝ නිරපරාදේ මරනයට පත්වූහ. 2005 දී කැත්රිනා කුනාටුවේදී ද 2004 ආසියානු සුනාමියේදී ද සිදුවූ පරිද්දෙන් ම හයිටියේ භූමිකම්පාවෙන් ද එලිදරව් කරනු ලැබ ඇත්තේ ධනවාදයේ කාලකන්නි යථාර්ථයයි.

04. ඇමරිකා එක්සත් ජනපදයේ වැඩකරන ජනතාව සියයට 10 ඉක්මවන විරැකියාවට ද රැකියා වැටුප් හා සමාජ සුබසාධන නිර්දය ලෙස කපා දැමීමට ද ලක්ව සිටිති. ගතවූ වර්ෂය තුල ලෝක ආර්ථිකයේ ව්‍යුහීය අසමතුලිතතා වෙලඳ හිඟයන්ට ද සහ මූල්‍ය සට්ටනයන්ට ද වෙලඳ යුද තර්ජනයන්ට ද පාත්‍රව තවතවත් උග්‍ර වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන ලෝක බලවතුන් අතර ආතතිය තවතවත් වැඩී තිබේ. වෙලඳපල සහ අනිකුත් ආර්ථික දර්ශකයන්ගේ කෙටිකාලීන ඉහල පහලයාම කොතරම් වූයේ වී නමුත් 2008 සැප්තැම්බර් 15 ගිනියම් ගලායාමට පෙර පැවති තත්වයට යලි ආපසු යාමක් ඇත්තේ නැත. මෙම අර්බුදය සලකුනු කරන්නේ දෙවන ලෝක යුද්ධයෙන් පසුව එක්සත් ජනපදයේ දේශපාලන සහ ආර්ථික නායකත්වය යටතේ තහවුරු කරන ලද ලෝක ධනවාදයේ ගෝලීය ව්‍යුහය බිඳ වැටීමයි.

05. අවුරුදු සියයකට පෙර 1910දී ලෝක ධනේශ්වර පද්ධතිය ඉතිහාසයේ අතිශයින්ම විනාශකාරී අර්බුදයේ මුවවිට ට එලඹ තිබුනි. එම යුගයේ වඩාත් තීක්ෂන සහ දූරදර්ශී මාක්ස්වාදී න්‍යායඥයන් - විශේෂයෙන් ම ලෙනින් ට්‍රොට්ස්කි සහ ලක්සම්බර්ග් - හැරෙන්නට අන් කිසිදු දේශපාලන චින්තකයෙක් එවකට නවමු වූ විසිවන සියවසේ දෙවන දශකය යුද්ධය සහ විප්ලවයේ මහ පෙරලි විසින් අරක්ගනු ඇතැයි සිතීමට සමත්වූයේ නැත. එසේ වුවද ලෝක ධනවාදයේ සහ එය විසින් පෝෂනය කරන ලද අධිරාජ්‍යවාදී පද්ධතියේ ඒකරාශි වූ ප්‍රතිසතිතා අනිවාරනීය ලෙස මහ ව්‍යසනයක් කරා ගමන් කරමින් තිබුනි. නව බලගතු ජාතික ධනපති රාජ්‍යයන්ගේ නැගීඒම නිසා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය ප්‍රමුඛ ගෝලීය දේශපාලන පද්ධතියට වලකැපෙමින් තිබුනි. මෙයට යුරෝපයේ ජර්මනිය ද ආසියාවේ ජපානය ද උතුරු ඇමරිකාවේ එක්සත් ජනපදය ද ඇතුලත් විය. ලෝක ආර්ථික පද්ධතියේ ප්‍රතිසතිතාවන්ගෙන් පැනනැගුනු මෙම ආතති අනෙක් අතට එම ප්‍රතිසතිතාවන් ම උග්‍ර කලේය. 1907 දී පුපුරා ගිය මූල්‍ය අර්බුදය වැනි අර්බුද ධනේශ්වර ප්‍රසාරනයේ දීර්ඝ කාල පරිච්චේදයක අවසානය සලකුනු කලේ ය. අන්තිමේදී 1914 ජූලි -අගෝස්තුවල දී පලුමුවෙනි ලෝක යුද්ධය පුපුරා ගියේ ය. ඉන් අවුරුදු තුනක් ගතවීමට පෙර 1917 මාර්තු මාසයේ දී රුසියන් විප්ලවය ඇරඹී ඔක්තෝබරයේ දී බොල්ශෙවික් වරුන් විසින් බලය අල්ලා ගැනීමට කරලිය සැකසී ය. මෙම ඓතිහාසික සිද්ධීන් ගෙන් ඇරඹුනේ 1945 දෙවන ලෝක යුද්ධයේ අවසානය දක්වා දික්වූ ආර්ථික හා දේශපාලන බිඳවැටීමේ කාල පරිච්ඡේදයකි.

06. සමහර තීරක අංශවලින් ගත් කල්හි 2010 ලෝකය පලවෙනි හා දෙවෙනි ලෝක යුද්ධය මුවවිට පැවැති තත්වයට සමාන ය. ආර්ථික අර්බුදය හා දේශපාලන ආතතීන් සහ සමාජ අස්ථාවරත්වය 1945 න් මොබ පැවති මොනයම් මැ තත්වයකට ද වඩා උග්‍ර වේ. එක් සුවිශේෂ කරුනක් වර්තමාන තත්වයට ඓතිහාසිකව නුවූ විරූ ගුනාංගයක් සම්පාදනය කරයි. ගෝලීය අස්ථාවරත්වයේ පෙර කාල පරිච්ඡේදයන්ට වඩා ඇමරිකා එක්සත් ජනපදයේ තත්වය අතිමූලිකව වෙනස් ය. අර්බුදයේ එයට පෙර පැවති සමයන්හි එක්සත් ජනපදය පැවතුනේ නැගීඑමින් සිටි ආර්ථික බලවතෙකු ලෙස ය. පලමුවෙනි ලෝක යුද්ධයෙන් ඉක්බිත්තේ එය ලෝක ධනවාදයේ කේන්ද්‍රය හැටියට යුරෝපයට පැවති තත්වය පැහැර ගත්තේ ය. දෙවන ලෝක යුද්ධය අවසන් වන කල්හි තම සියලු ධනපති පිලිමලුන් මත අනභියෝගී ආර්ථික සහ දේශපාලන ආධිපත්‍යයක් පිහිටුවා ලීමට එක්සත් ජනපදය සමත් විය. ලෝක ධනවාදයේ පුනස්ථායී කරනයට නව අත්තිවාරමක් පිහිටුවීමට එක්සත් ජනපදයේ ඉමහත් සම්පත් තීරනාත්මක විය.

07. ඇමරිකානු ආර්ථික ආධිපත්‍යයේ යුගය හමාර වී ඇත. තමන් අත ඇති ඉමහත් යුද්ධමය සම්පත් තිබියදී ම අද ඇමරිකා එක්සත් ජනපදය ලෝක ආර්ථික රටාව තුල වේගයෙන් පිරිහී යන බලයක් බවට පත්ව සිටී. එක්සත් ජනපදයේ ආර්ථික සහ දේශපාලන තත්වයේ මෙම ගැඹුරු මාරුවීම එරටට පමනක් නොව මුලුමහත් ලෝකයට ම අතිශය දූරගාමී ගම්‍යයන් දරා සිටී. තම ගෝලීය ආධිපත්‍යයට එල්ලවන්නා වූ අභියෝගයන් වලක්වා ලීමට ද තම ආර්ථික පරිහානියේ බර තම තරග කරුවන්ගේ කොඳු මතට මාරු කර යැවීමට ද ඇමරිකා එක්සත් ජනපදය දරන වඩවඩාත් ආක්‍රමනික ප්‍රයත්න ජාත්‍යන්තර ආර්ථිකය හා දේශපාලනය දරුනු ලෙස කඩාකප්පල් කරන්නාවූ සාධකයන් ලෙස වඩවඩාත් උග්‍ර වේ.

08. 2007 -2008 බිඳවැටීම ගෝලීය භූ දේශපාලන හා ආර්ථික සම්බන්ධතාවන්හි ඉමහත් ප්‍රතිව්‍යුහ කරනයක් ඇරඹී ය. මෙම වලිප්පු සහගත ක්‍රියාවලියෙන් පැනනගින අර්බුදය විසඳීමට ඇත්තේ විකල්ප මාර්ග දෙකකි. ඒ දෙකෙන් ධනේශ්වර විසඳීම නම් ඇමරිකානු සහ ජාත්‍යන්තර කම්කරු පන්තියේ ජීවන තත්වයන්හි අන්ත බිඳදැමීම ය; ලොවපුරා මර්දනය ය. කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් විනාශ කිරීම සහ දෙවන ලෝකයුද්ධයෙන් මොබ නොවූවිරූ තරම් උග්‍ර වූ මිලිටරි ප්‍රචන්ඩත්වය ලිහා හැරීමය. එම ධනේශ්වර විසඳුමට එකම විකල්පය නම් සමාජවාදී විප්ලවය යි: එය වනාහී ඇමරිකානු සහ ජාත්‍යන්තර කම්කරු පන්තිය විසින් දේශපාලන බලය අල්ලා ගැනීම කාර්මික මූල්‍යමය සහ ස්වාභාවික සම්පත් මත මහජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය පිහිටුවා ලීම ද ලාභය හා පෞද්ගලික ධනය සොයා විනාශකාරී ලෙස දිවයාම වෙනුවට සමස්තයක් වශයෙන් සමාජයේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා විද්‍යාත්මකව කැපවූ ගෝලීය ආර්ථිකයක් වර්ධනය කිරීම ය.

## දශකය පිලිබඳ සමාලෝචනයක්

09. වර්ෂ 2000, ආරම්භ වත්ම භූතලය හරහා බිලියන සංඛ්‍යාත ජනකාය - ප්‍රචන්ඩ බවින්, දිලිඳුකමින් සහ දුක් වේදනාවෙන් ගතවූ ශතකවර්ෂය තරම් දරුනු නොවූ - වඩා හොඳ ලෝකයක් නව සියවසේ දී එලඹෙනු ඇතැයි අපේක්ෂා කලෝ ය. නව සහශ්‍රකයේ ආරම්භය ජාත්‍යන්තරව අවංක හා ගැඹුරු අපේක්ෂාවන් පිබිදවීය. අවුරුදු දහයකට පසු එම බොලඳ ප්‍රාර්ථනයන්ගෙන් කිසිවක් ඉතුරුව නැත. මහ ජනතාවගේ ජීවන තත්වයන් තවතවත් නරක අතට හැරෙමින් පවතිතැයි ද සමාජය පස්සට හැරීම අරඹා ඇතැයි ද පොදු හැඟීමක් පැතිර පවතී.

10. පාලක ප්‍රභූන් හා ඔවුන්ගේ දේශපාලන නියෝජිතයන්නව ශතවර්ශය පිලිගත්තේ ඉහත කී ප්‍රාර්ථනයන්ට වඩා මුලුමනින්ම වෙනස් වූ අපේක්ෂා සහිතව ය. ඔවුහු විසිවන ශතවර්ශයේ දී ධනේශ්වර ක්‍රමයේ පැවැත්මට ම තර්ජනය කලා වූ අර්බුද සහ විප්ලවවාදී මහ නැගිටීම් අතීතයට අයත් දේවල් යයි විශ්වාස කලහ; පන්ති අරගලයේ පදනම් කරගත් මානව ප්‍රගතියේ වාර්තාව වූ ඉතිහාසය දැන් ඉවර වී ඇතැයි ද ඔවුහු විශ්වාස කලහ. සමාජවාදයේ අවතාර එනම් සමානතාවය සඳහා මහා ජනයා කරන්නා වූ අරගලය තීන්දුවට ම එලවාදමා ඇත. අසීමිත බලය පිලිබඳ විපරීත උද්ධච්චය ඇමරිකා එක්සත් ජනපදයේ දී තරම් බාන් කඩාගත් වෙනත් තැනක් ඇත්තේ නැත. නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳවැටීමේ ද සෝවියට් සංගමය විසුරුවා හැරීමේද ඉක්බිත්තේ ඇමරිකානු පාලක පන්තිය තමන්ගේ සුවිශේෂ නිදහස් වෙලඳපල ධනවාදය විජයග්‍රාහීව සනාථ කරනු ලැබ ඇතැයිද ලෝකයේ එකම "සුපිරි බලවතා " හැටියට එක්සත් ජනපදයේ ගෝලීය අධිකාරයට අභියෝග කල හැක්කෙක් නැතැයි ද පිම්බී එන කොටස් වෙලඳපොල එන්න එන්නම වැඩි වන්නාවූ පෞද්ගලික ධනය රාශිභූතකර ගැනීම සහතික කරතැයි ද ඒත්තු ගෙන සිටියේ ය. අර්ථශාස්ත්‍රඥයින් අතර වඩාත් නිර්භීත වූවෝ විසිඑක්වන සියවසේ දී වානිජ චක්‍රය පවා ඇනහිටිනු ඇතැයි අනාවැකි කීහ.!

11. එහෙත් ඔවුන් සිතුවාට හෝ බියවූවාට වඩා ඉක්මන් ව යථාර්ථය කඩා වැදුනි විය. පසුගිය දශකය පාලක පන්තියේ පුරාජේරු ආත්ම විශ්වාසයට බරපතල පහර එල්ල කොට තිබේ. ප්‍රීතියෙන් උමතුවීමේ සිට භීතියෙන් ඇලලීයාම කරා මනෝභාවය මාරුවීයාම මාධ්‍යයන්හි දක්නට ලැබෙන බොහෝ දිරිසුන් ලියවිලිවල පිලිබිඹු වෙයි. ටයිම්ස් සඟරාවේ පිට කවරයේ "අපායේ දශකය" යන ලිපියක් මෙසේ සඳහන් කරයි, " 9/11 න් ඇරඹී මූල්‍යමය හෝදාපාලුවකින් අවසන් වූ මෙම ශතවර්ෂයේ ප්‍රථම දස වසර වනාහී දෙවන ලෝක යුද්ධයෙන් පසු සමයේ ඇමරිකානුවන් ගත කල වඩාත්ම අපේක්ෂා නසන්නාවූ හා සිත් කලකිරවන්නා වූ දශකය ලෙස ඉතිහාස ගත වනු ඇත." ඩර් ස්පියගල් නම් ජර්මානු සඟරාව මෙසේ ලියයි, "එය වනාහී අර්බුද වර්ෂවලින් පිරි දශකයකිඃ 9/11 අර්බුදය, දේශගුනික අර්බුදය, මූල්‍ය අර්බුදය සහ ප්‍රජාතන්ත්‍රයේ අර්බුදය. මේ සියල්ල එක්ව ගත් කල්හි ඒවා නියෝජනය කරන්නේ බටහිර බලවතුන්ට පොදු අර්බුදයකි. තත්වය මීටත් වඩා නරක් විය හැකිව තිබුනේ නැත." බ්‍රිතාන්‍ය ටයිම්ස් පුවත්පත මෙසේ එකතු කරයිඃ " අද දින ඇමරිකාව 21 සියවසේ ආරම්භයේ පැවති ඇමරිකාව සමග සසඳන කල්හි පෙනී යන්නේ සමහර ආකාරවලින් තමන් පිලිබඳව ද සෙසු ලෝකය සමග තමන්ගේ සම්බන්ධතාවය පිලිබඳව ද පැවති අදහස් සමූලිකව වෙනස් කර ගත්තා වූ රටකි. කොටින් කිවහොත් පරිහානියේ මලකඩ ඇමරිකානු ආත්මය තුලට කාවැදී ඇත."

12. 21 වන ශතවර්ෂයේ දී ඇමරිකානු ධනවාදය එක්සත් ජනපදය ඇතුලත හා පිටත සෑම ක්ෂේත්‍රයක දී ම තම වැඩ කටයුතු වලදී , අපරාධකාරී බවට ඇදවැටුනි. විදේශ පිලිවෙතේදී ඇමරිකානු පාලක පන්තිය 2001 සැප්තැම්බර් 11 සිද්ධීන් - ඒවායේ නොපැහැදිලි හේතුමූලයන් තාමත් ඇති තරම් පරීක්ෂාකොට හෝ පැහැදිලි කොට ඇත්තේ නැත - පාවිච්චියට ගෙන ඇමරිකානු ආන්ඩුවේ ද මිලිටරියේ හා රහස් ඔත්තු සේවාවන්හි ද ඉහලම මට්ටම් තුල තරයේ සාකච්ඡා වූ ගෝලීය අරමුනු අත් කර ගැනීම සඳහා යොදාගන්නා ලදී. ඇමරිකා එක්සත් ජනපද ආන්ඩුව මාධ්‍යවල ආධාරය ද ලැබ ඇෆ්ඝනිස්ථානය හා ඉරාකය ආක්‍රමනය යුක්තිසහගත කිරීමට බොරු කීවේ ය."ත්‍රස්ත විරෝධී යුද්ධය" යොදා ගැනුනේ ජාත්‍යන්තර නීති උල්ලංඝනය කරමින් ඇමරිකානු යුද හමුදාවන් වඩවඩාත් පුලුල් ලෙස මධ්‍යම ආසියාව ද මැදපෙරදිග ද වඩාත් මෑත දී අප්‍රිකාවේ කේප්හෝන් ප්‍රදේශය තුල ද පැලපදියම් කරවීමට ය. ඇමරිකානු පාලක පන්තිය අධිෂ්ඨාන කර ගෙන සිටින්නේ තමන්ගේ ගෝලීය තත්වය ආරක්ෂා කර ගැනීම සඳහා සකල ලෝකයේ ම තීරනාත්මක භූ-මූලෝපායික ප්‍රදේශ තම පාලනයට නතු කර ගැනීමට ය. මෙම යුද්ධමය ආක්‍රමනය 2009 ඇෆ්ඝනිස්ථානය තුල ඔබාමා පාලනාධිකාරයේ "සර්ජ්" (ඉදිරි පිම්ම) ද පවත්නා සහ විභව ඉලක්කයන් ලැයිස්තුවට තවත් රටක් - යේමනය - එකතු කිරීම ද සමග තවදුරටත් පලල් විය.

13. ලෙනින් ශතවර්ශයකට පෙර ලියාතැබූ පරිදි අධිරාජ්‍යවාදය වනාහී "හිස සිට දෙපතුලටම ප්‍රතිගාමීත්වයයි." අද අප දකින්නේ මිනිසාගේ "අවියෝජනීය" අයිතිවාසිකම් සමග උපත ලද ජාතිය (ඇමරිකා එක්සත් ජනපදය) ප්‍රචන්ඩත්වයේ ද මහා භීෂනයේ ද පුද්ගලයන්ට එරෙහි මුර්ගතවයේ ද කර්තෘ බවට පත්ව ඇත. ගතවූ දශකයේ දී එක්සත් ජනපද ආන්ඩුව සහ එහි හවුල්කරුවෝ දැන් රාජ්‍ය නිර්මිත

පරපීඩනයේ ද අමානුෂිකත්වයේ ද සමාන පද ලෙස දැන් සාමාන්‍ය භාවිතයට ඇතුලත්ව පවත්නා වචන හා වාක්‍යාංශ ගනනාවක් ම හඳුන්වා දුන්හ: "ගුවන්තනාමෝ", "අබුග්‍රායිබ්", "බ්ලැක්වෝටර්", "එනිමි කම්බැටන්ට්" (සතුරු සටන්කරුවා), එන්හේස් ඉන්ටරොගේෂන් (උත්සන්න ප්‍රශ්න කිරීම), වෝටර් බෝඩිං (ටිකෙන්ටික වතුරේ ගිල්වා වධ දීම ), රෙන්ඩිෂන් (නීති විරෝධී ලෙස සිරකරුවෙකු විදේශය රාජ්‍යයකට පැවරීම), බුෂ් චේනි සහ රම්ස්ෆෙල්ඩ්.

14. ආර්ථිකයේ දී නීතියුක්ත ව්‍යවසාය ද සමපේක්ෂනය සහ පරිපූර්න වංචාව ද අතර මායිම් මකාදමන ලදී . 2000දී ඩොට් කොම් කොටස් වෙලඳපල බුබුල බිඳවැටෙමින් ඉක්බිති 2001 දී එන්රොන් සමාගමේ බංකොලොත් බවින් ඇරඹුනු දශකයක් අවසන් වූයේ උගස් කර පදනම වූ කොටස් බුබුල බිඳ වැටීම ද ලෝක පරිමාන මූල්‍ය භීතිකාවක් ද බැංකු ගලවාගැනීමට ට්‍රිලියන ගනන් ඩොලර් යට කිරීම ද සමග ය. අතලොස්සක් අත සිත්සොලවන තරම් දැවැන්ත ධනස්කන්ධයක් සංකේන්ද්‍රනයව පවත්නා අතර ඇමරිකා එක්සත් ජනපදයේ සමාජ අසමානතාව අසභ්‍ය පරිමානයක් අත් කර ගත්තේ ය. සමාජ අසමානතාවය දරුනු ලෙස වැඩීඒම "කාර්මික සමාජයක සිට ඉන්ෆොමේෂන් බේස්" (තොරතුරු සැපයීම මත පදනම් වූ) සමාජයක් කරා සංක්‍රමනය වීම සමග රැඳුනාවූ තාවකාලික ප්‍රපංචයක් යැයි එක්තරා සමයකදී ධනවාදයේ ක්ෂමාලාපකයන් විසින් තර්ක කරන ලදී. එහෙත් පසුගිය දශකයේ වර්ධනයන් විසින් උවමනාවටත් වඩා පැහැදිලි කර ඇත්තේ අසමානතාවයේ අන්ත මට්ටම් ලාබ ගරන පද්ධතියේ රාමුව තුල අනිවාර්ය බවය; තවතවත් උග්‍රවන බවය. ඇමරිකානු සමාජය මූල්‍යමය සහ මහා සංගතවල පරපුට්ටන් විසින් පාලනය කරනු ලබන කතිපයාධිකාරයක් බවට පිරිහී ඇත. මොවුන්ගේ ආසක්තයන් සහ අවශ්‍යතාවයන් දේශපාලන වශයෙන් ප්‍රතිගාමීය; ආර්ථික වශයෙන් අතාර්කිකය ය; සංස්කෘතිමය වශයෙන් පසුගාමී ය; සමාජයේ සෞඛ්‍යයට සහ ප්‍රගතියට සිතිය හැකි සෑම අන්දමින් ම විනාශ කාරී ය.

15. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රජාතන්ත්‍ර සංස්ථාවන් ගේ තත්වය සමන්විත වන්නේ අපාලිත යුදවාදය මූල්‍යමය පරපුටුබව සහ සමාජ අසමානතාවයේ බලපෑම් වලිනි. ගතවූ දශකය ඇරඹුනේ 2000 ජනාධිපති තරගය සොරාගැනීමත් සමග ය. ෆ්ලොරිඩාවේ ඡන්ද යලි ගනන් කිරීම වලක්වා ලීමට ශ්‍රේෂ්ඨාධිකරනයේ විනිශ්චය කරුවන් 5ට 4 වශයෙන් දුන් තීන්දුව සිය විරුද්ධවාදියාට වඩා මිලියන භාගයක් අඩුවෙන් ඡන්ද ලබා මැතිවරනයෙන් පැහැදිලිව ම පරාජවට පත්වූ අපේක්ෂකයා බලයට පත් කලේ ය. ඉනික්බිති මැතිවරන වලදී ඇමරිකානු ජනයා එක්සත් ජනපද ආන්ඩුවට තම විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට උත්සාහ කලහ. එහෙත් ඒ සෑම අවස්ථාවක දී ම මහජනතාවගේ හැඟීම යටපත් කොට නොමග යවා නොතකා හරින ලද අතර මෙම ක්‍රියාවලියේ දී ඩිමොක්‍රටික් පක්ෂය ද එහි විවිධ ලිබරල් සහ මධ්‍යම පන්තික සහකරුවෝ ද තීරක භූමිකාවක් ඉටු කලහ.

16. ඇමරිකානු ඉතිහාසයේ අතිශයින්ම වෛර කරනු ලැබූ ජනාධිපති වරයා ලෙස බලයෙන් ඉවත්ව ගිය බුෂ් ගේ අට අවුරුද්දකින් පසු ජනයා බැරැක් ඔබාමාව තෝරා පත් කර ගත්හ. පලල් මහජන අසහනය ට ආයාචනා කරමින් තමා "පැතුමේ" සහ "වෙනසේ" අපේක්ෂකයා ලෙස අලෙවි කර ගත් ඔබාමා ප්‍රථම අප්‍රිකානු ඇමරිකානු ජනාධිපති වරයා ලෙස තෝරා පත් විය. එහෙත් ඔහුගේ පලමුවෙනි අවුරුද්දේ දී ම නිසැක ලෙස එලිදරව් වී ඇත්තේ වැදගත් කිසිම දෙයක්, හොඳ අතට නම්, වෙනස් නොවන බවය. සිය ජනවාර්ගින පසුබිම නිසා සාමාන්‍ය ජනයාගේ ගැටලුවලට වඩාත් සංවේදී වෙතැයි සිතන ලද මිනිහෙක් ජනාධිපති ධූරයට පත් කර ගත් වැඩ කරන ජනයා දැන් වටහාගෙන ඇත්තේ ඔහු වනාහී පෝසතුන් සමග පමනක් සහානුකම්පික වූ ගල්හිතක් ඇති මිනිහෙක් ජනාධිපති බවට පත් කරගෙන ඇති බවය. බුෂ් පාලනාධිකාරය සමග "සෑම අංශයක දී ම" ඔබාමාගේ පැහැදිලි අඛන්ඩතාවය මහජන මතය ඔහුගෙන් ඈත් කරමින් මෑත දී මැසචුසෙට්ස් රාජ්‍ය මැතිවරනයේ දී ඩිමොක්‍රටික් පක්ෂයට හිරිවට්ටන පරාජයක් ලබා දුනි. "වෙනසේ අපේක්ෂකයා දස ලක්ෂ ගනන් ජනයාට ඔප්පු කර සිටින්නේ පවත්නා දේශපාලන සංස්ථාවන් තුලින් සැබෑ වෙනසක් ඇති කරගත නොහැකි බවය. මිනිසුන්ට "විශ්වසනීය වූ එකම වෙනස" වනාහී සමාජවාදය උදෙසා කම්කරු පන්තිය විසින් කරනු ලබන දේශපාලන අරගලය තුලින් පැනනගින්නා වූ වෙනසයි.

## 2010 ලෝක තත්වය

17. ලෝක ධනවාදයේ අර්බුදය මුල්බැස පවත්නේ ධනේශ්වර පද්ධතියේ ප්‍රතිසතිතා තුලය. එම ප්‍රතිසතිතා වනාහී සමාජීකරනය වූ නිෂ්පාදනය සහ නිෂ්පාදන බලවේගයන්ගේ පුද්ගලික අයිතිය අතර ද ගෝලීය ආර්ථිකය සහ ජාතික රාජ්‍ය පද්ධතිය අතර ද වේ. අද මෙම ප්‍රතිසතිතාවන්ගේ අතිශයින්ම සංකේන්ද්‍රනීය ප්‍රකාශනය පවත්නේ තමන්ගේ ආසක්තයන් විදේශයන්හි යුද්ධ ද ස්වදේහය තුල සූරා කෑම උග්‍ර කිරීම ද මගින් ආරක්ෂා කර ගැනීමට අධිෂ්ඨාන කරගෙන ඉන්නා වූ ප්‍රභුවක් විසින් පාලනය කරනු ලබනඇමරිකා එක්සත් ජනපදයේ ය. දෙසැම්බරයේ දී නොබෙල් තෑග්ග පිලිගනිමින් කල කතාවේ දී ඔබාමා තම නව පාලනාධිකාරය යටතේ ඇමරිකානු අධිරාජ්‍ය වාදයේ ආක්‍රමනකාරී ප්‍රසාරනය දිගින් දිගටම පවත්වාගෙනයන බව අවධාරනය කලේ ය. ඇෆ්ඝනිස්ථානයේ යුද්ධය

උත්සන්න කිරීමෙන් සතියකට පසු ඔබාමා විසින් කරන ලද මෙම කතාව ඇමරිකා එක්සත් ජනපදයට "අවශ්‍යනම් ඒකපාක්ෂිකව ක්‍රියාකිරීමට" අයිතියක් ඇති බව ද "ආක්‍රමනිකයෙකුට එරෙහිව එක් ජාතියකගේ ආත්මාරක්ෂාව (පිලිබඳ ප්‍රශ්නයෙන්) ඔබ්බට දිවෙන්නා වූ යුද්ධයන් දියත් කිරීමට ඇමරිකා එක්සත් ජනපදයට අයිතියක් ඇති බව ද අවධාරනය කලේ ය. වෙනත් වචනවලින් කිවහොත් "ලෝකයේ එකම මිලිටරි සුපිරි බලවතා " යයි ජනාධිපතිවරයා විසින් අවධාරනය කරනු ලබන ඇමරිකා එක්සත් ජනපදය ඕනෑම රටක් ඔනෑම ව්‍යාජයක් උඩ ආක්‍රමනය කිරීමට ඇති අයිතිය නිවේදනය කර තිබේ.

18. ඇමරිකානු පාලක පන්තියේ අපේක්ෂාවන් මොනවා වුවද, යුද බලය මගින් තම ආර්ථික පරිහානිය වලක්වා ගත හැකිය යන විශ්වාසය වනාහී ඉමහත් ව්‍යසනකාරී ප්‍රතිඵල ලබා දිය හැකි ප්‍රතිගාමී මිථ්‍යාවිශ්වාසයකි. මිලියනයකට වැඩි ජනකාය ඝාතනය කරමින් ද කලෙක නවීන සමාජයක්ව පැවති එරට විලෝපනය කරමින් ද ඉරාකයේ දී එක්සත් ජනපදය සමත් වී ඇත්තේ නිරන්තර සිවිල් යුද්ධයක් ලෙස පිපිරී යාමට තර්ජනය කරන්නා වූ විවිධ නිකාය වාදී ආසක්තයන් මුදුනේ අඩමාන ලෙස රැඳීපවත්නා අස්ථාවර රූකඩ ආන්ඩුවක් පිහිටුවීමට ය. ඇෆ්ගනිස්තානයේ දී අට අවුරුද්දකට වැඩි යුද්ධයක් මගින් එක්සත් ජනපදය ස්ථාපනය කර ගැනීමට සමත් වී ඇත්තේ එතරම් ම අස්ථාවර පාලන තන්ත්‍රයක් සහ එන්න එන්නම ඇමරිකානු අධිරාජ්‍යවාදයට වියට්නාමය සමානවන්නා වූ තත්වයකි.

19. මෙම යුද්ධවලින් ඔබ්බේ එක්සත් ජනපදය මුහුන දී සිටින්නේ එහි තත්වයට තර්ජනය කරන්නා වූ නැගීඑන ප්‍රාදේශීය සහ ගෝලීය බලයන් රොත්තකට ය. ඊට ඉරානය, ඉන්දියාව, බ්‍රසීලය, සහ අන් සියල්ලටමත් වඩා චීනය ද ඇතුලත් වේ. එසේ ම යුරෝපය තුල පැරනි බලවතුන් සහ රුසියාව ද පවතී. තමාට වඩා කුඩා බලවතුන් මත ආධිපත්‍යය දැරීමට එක්සත් ජනපදය දරන්නා වූ ප්‍රයත්නය එන්න එන්නම වැඩිවැඩියෙන් පලල් වෙනනා වූ ලෝක ගිනිජාලාවක් අවුලුවාලීමට තර්ජනය කර සිටී. නව ලෝක යුද්ධයක් පුපුරා යාම අත්පත් කර ගත හැක්කා වූ විවිධ ස්වරූප දුසිම් දෙකක් වුව ඉදිරිපත් කල හැක.

20. අද ලෝක හූ දේශපාලන තත්වයේ අතිශය දහන ශීලී අංශයන්ගෙන් එකක් නම් ඇමරිකා එක්සත් ජනපදය හා චීනය අතර පවත්නා සම්බන්ධතාවයි. චීනය එක්සත් ජනපදයට අභියෝගයක් වන්නේ එරට ප්‍රාදේශීය වානිජ සංවිධාන පිහිටුවීමට වැඩකරමින් සිටින්නා වූ නැගෙනහිර ආසියාවේ පමනක් නොවේ; මධ්‍යම ආසියාව මැදපෙරදිග අප්‍රිකාව සහ ලතින් ඇමරිකාව ද මෙයට අයත්ය. එක්සත් ජනපදයේ පිරිහීම චීනයේ දැවන්ත ආර්ථික වර්ධනය හා සම්පාතව ඇත. දැනට ලෝකයේ දෙවන ආර්ථිකය අයත් චීනය විශාලතම අපනයන කරුවා ලෙස මෑතදී ජර්මනිය පරයා ගියේ ය. ඇමරිකා එක්සත් ජනපදය ප්‍රධාන නය හිමියාගේ සිට ප්‍රධාන නය කරුවා බවට පරිවර්තනය වත්ම එක් ට්‍රිලියනයක තරම් ඇමරිකනු නයකර අතැතිව සිටින චීනය ලෝකයේ විශාලතම ගිනුම් අත් කර ගෙන සිටී.

21. අර්බුදයේ තතු යටතේ එක්සත් ජනපදය සහ චීනය අතර පවත්නා අන්තර් සම්බන්ධතාව ආතතියෙන් පිරී පවතී. දෙසැම්බරයේ කෝපන්හේගන්හි පැවැත්වුනු දේශගුනික විපර්යාස සමුලුව මෙම දෙරට අතර ද එක්සත් ජනපදය සහ යුරෝපය අතර ද පවත්නා ආතති සහගත භාවය පෙන්නුම් කලේ ය. අලුත් අවුරුද්ද ආරම්භයේ දී එක්සත් ජනපදය තායිවානයට නව අවි සැපයීම අනුමත කිරීමේ සැලැස්මට ද දලයිලාමා සහ ඔබාමාගේ හමුවීමට ද චීනය කටුක ප්‍රතිචාරයක් දැක්වූයේ ය. චීනය තම මුදලේ වටිනාකම වැඩි කල යුතු යයි ඇමරිකාව නිරන්තරව බල කර ඇති අතර එක්සත් ජනපදයේ ෆෙඩරල්රිසව් ආයතනයේ (මහ බැංකුවේ) ලිහිල් මූල්‍ය පිලිවෙත ඩොලරයේ අගය ට වලකැපීමට ද සමස්ත ලෝක මූල්‍ය වෙලඳපලම අස්ථායීකරනය ට ද යොමු වන බවට චීනය අනතුරු හඟවා ඇත. මූල්‍ය හෝ වෙලඳ යුද්ධයක් පිලිබඳ සැබෑ තර්ජනයක් පවතී. ඇමරිකා එක්සත් ජනපදය දැනට ම වානේ සහ ටයර් ඇතුලු චීන අපනයනයන් ගනනාවකට ම බදු පනවා ඇත. ලිබරල්වාදී *නිව්යෝර්ක් ටයිම්ස්* ලේඛක පෝල් කෘග්මන් චීනයට එරෙහි කලහකාරී ලිපියකින් අවුරුද්ද අවසාන කලේ ය. ("චයිනීස් නිව් ඉයර්" දෙසැම්බර් 31) චීනයේ ආර්ථික සහ වෙලඳ පිලිවෙත "කොල්ලකාරී" යැයි චෝදනා කල කෘග්මන් මෙසේ අනතුරු ඇඟවීය, "චීන මර්කන්ටයිල්වාදය (වෙලඳවාසි) ලබාගැනීමේ දෘෂ්ටිය එන්න එන්නම උග්‍ර වන ගැටලුවකි. එම මර්කන්ටයිල්වාදයට ගොදුරුවී සිටින රටවල්වලට වෙලඳ සට්ටනයකින් අවාසියක් සිදු වන්නේ නැත. එහෙයින් චීන ආන්ඩුව තම දඩබ්බර භාවය ගැන යලි සලකා බැලියයුතු යයි මම යෝජනා කර සිටිමි. එසේ නොකලහොත් දැනට චීන ආන්ඩුව දෝෂාරෝපනය කරමින් සිටින්නා වූ (අන්රටවල වත්මන්) ආරක්ෂනවාදය එයටත් වඩා විශාල දෙයක ආරම්භය බවට පත් වනු ඇත." මීට කලින් ලියන ලද ලිපියක මාටින් වුල්ෆ් නමැති මූල්‍ය විමර්ශකයා ඔබාමා චීන ජනාධිපති හූ ජින්ටාවෝට කියන්නට ඇත්තේ කුමක් දැයි තමාට සිතුනු පරිදි මෙසේ දැක්විය. "ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් මිතුරු අත දික්කිරීමේ සිට සතුරු මිට මෙලවීම කරා කොතරම් ඉක්මනින් මාරු වනු ඇත්දැයි ඔබට සිතාගත නොහැකි වනු ඇත."

22. චීනයේ ද ඉන්දියාවේ ද බ්‍රසීලයේ ද අනෙකුත් රටවලද ආර්ථික වර්ධනය ඉදිකර ඇත්තේ වියරු දරිද්‍රතාවයෙන් ද අසමානතාවයේ කම්පාකාරී මට්ටම්වලින් ද තැලී පොඩිවී ගිය සමාජයන් මත ය.

ඔවුන්ගේ දේශපාලන ව්‍යුහයෝ මහජන අතෘප්තියට බෙහෙවින් ම විවෘතය. තමන්ගේ මුදල්වල වටිනාකම ඉහල දැමිය යුතු යයි ඇමරිකාව කරන බලපෑමට චීනය නොඑකඟ වන්නට ප්‍රධාන හේතුවක් නම් මුදලේ වටිනාකම වැඩිකිරීමෙන් අපනයන පහත වැටී විරැකියාව පිම්මේ ඉහලගොස් තම පාලන තන්ත්‍රය අස්ථායී කරනය වෙතැයි යන භීතිය ය.

23. භූ-දේශපාලන සට්ටනයේ තවත් ප්‍රමුඛ අංග පවතී. සෝවියට් සංගමය බිඳ වැටීම ඇමරිකා එක්සත් ජනපදය විසින් මධ්‍යම ආසියාව නැගෙනහිර යුරෝපය සහ කෝකේසස් ප්‍රදේශයන් බඳු රුසියාවේ වැයික්කිය යයි සම්ප්‍රදායික සලකනු ලැබූ ප්‍රදේශ තුලට කඩා වැදීමට අවස්ථාවක් ලෙස දැකගන්නා ලදී. විශේෂයෙන්ම ජෝර්ජියාව යුක්රේනය වැනි ප්‍රදේශවල දී තම ආසක්තයන්ට වඩාත් නැමෙන සුලු වූ පාලන තන්ත්‍රයන් බලයට පත් කිරීමේ ප්‍රයත්නයක් තුල "කලර් රෙවලූෂන්ස්" (වර්න විප්ලව) මාලාවකට ඇමරිකා එක්සත් ජනපදය සහාය දුනි. එක්සත් ජනපදයේ ආධාර ලත් ජෝර්ජියාව 2008 ගිම්හානයේ දී දකුනු ඔසේටියාවේ රුසියාවට පක්ෂ සමූහාන්ඩුව ආක්‍රමනය කිරීම එක්සත් ජනපදය සහ රුසියාව අතර සට්ටනය පුපුරා එලියට ඒම ආසන්න කලේ ය.

24. එක්සත් ජනපදය සහ යුරෝපය අතර සම්බන්ධතාවය ගතහොත් ඉරාක යුද්ධය ආසන්නයේ දී ඉස්මත්තට ආ ආතතතීන් තවමත් පැසවමින් පවතී. සීතල යුද්ධ කාල පරිච්චේදයේ දී ඇමරිකා එක්සත් ජනපදය බටහිර යුරෝපය සමග සන්ධානයක් අවධාරනය කලේ ය. යුරෝපය යලි ගොඩ නැගීම ද ජාත්‍යන්තර සංස්ථාවන් වගාකිරීම ද ඇමරිකානු පාලක පන්තිය සෝවියට් සංගමය සිර කොට යුරෝපය තුලම සමාජවාදී විප්ලවය පැන නැගීම වැලැක්වීම සඳහා දරන ලද ප්‍රයත්නයක කොටසකි. දැන් එක්සත් ජනපද යුරෝපා සම්බන්ධතාවය තුල වඩාත් මූලික ප්‍රවනතාවයක් යලි ඉස්මත්තට එමින් පවතී. එය වනාහී යුරෝපයේ වියදමෙන් ඇමරිකානු බලය තහවුරු කර ගැනීම ය. ඔබාමාගේ ජයග්‍රහනය එක්සත් ජනපදය "බහුපාක්ෂිකතාවය" කරා ආපසු ගමන් කිරීමක් සලකුනු කරනු ඇතැයි යුරෝපීය බලවතුන් අතර පැවති මිථ්‍යාව කුඩු පට්ටම් කරනු ලබ ඇත.

## ඇමරිකාවේ සමාජ අර්බුදය

25. ඇමරිකා එක්සත් ජනපදය වනාහී ලොව අතිශයින්ම බියපත් රට යයි ලියොන් ට්‍රොට්ස්කි දශක ගනනාවකට පෙර විස්තර කලේ ය. ඇමරිකා එක්සත් ජනපදය ලෝකයේ මහත්ම කාර්මික බලවතා ලෙස පවතින සමයේ දී කරන ලද මෙම නිරීක්ෂනය පෙර කවර කලෙකටත් වඩා අදට අදාල ය. ඇමරිකානු පාලක පන්තිය ලෝක ගෝලයේ සෑම තැනක ම අභියෝග තර්ජන සහ මාරාන්තික අන්තරාය දැකගනී. එහෙත් එහි ආධිපත්‍යයට ඇත්තා වූ ඉමහත්ම අභියෝගය පවතින්නේ එක්සත් ජනපදය ම ඇතුලත ය. ඇමරිකානු ජනගහනයෙන් ඉතා කුඩා ප්‍රතිශතයක් තුල අති මහත් සම්පත් සම්භාරයක් ඒකරාශීව පවතින්නා වූ අත්‍යසමාන්‍ය පරිමාව සමාජ ස්ථාවරත්වය සමග කිසිසේත් ම ගැලපෙන්නේ නැත. මහත් අසමානතාවය ඇමරිකානු සමාජයේ මූලික ලක්ෂනයකැයි යන එන්න එන්නම වඩවඩාත් පැහැදිලිවන කරුන පලල් කම්කරු ජනතාව අතර ගැඹුරු වූ ද දිගුකල් පවත්නා වූ ද වෙනස්කම් ඇති කරයි. කම්කරු පන්තිය සූරා කෑමට සහ අයුක්තියට දක්වන්නා වූ ප්‍රතිරෝධය යටපත් කර දැමීමට ප්‍රතිගාමී වෘත්තීය සමිතිවලට ඇති හැකියාව එහි අවසන් සීමාව කරා ලඟාවෙමින් පවතී.

26. ඇමරිකා එක්සත් ජනපදයේ පලල් ජනකායේ තත්වයන් දිගින් දිගට ම පිරිහී යමින් පවතී. හතලිස් මිලියනයක් ජනයා දිළිඳුකමේ ගැලී සිටිති. හය මිලියනයකට ආදායමක් නැති අතර ඔවුන් පන ගැටගසා ගන්නේ තනිකරම ආහාර මුද්දර වලිනි. ගතවූ දශකය අග වන විට එක්සත් ජනපදයේ නිල විරැකියාව සියයට 10 මට්ටම කරා ලංවී පැවතුනි. 2009 දී රැකියා මිලියන 4.2ක් වනසන ලදී. ජනවාරි 8දා එලිදැක්වුනු අලුත්ම තොරතුරුවලින් පෙන්නුම් කරන්නේ එක්සත් ජනපදය දෙසැම්බරයේ දී පමනක් තවත් රැකියා 85,000ක් අහෝසි කල බවය. නිල විරැකියා මට්ටම ස්ථාවරව පැවැත්තේ දස දහස් ගනන් විරැකි ජනයා රැකියා සෙවීම සරලව ම අතහැර දමා ඇති හෙයින්ම පමනි. රැකියා සොයන්නන් යැයි ආන්ඩුව විසින් සැලකෙන නිල ශ්‍රම බලකාය එම මාසයේ දී සැබවින් ම 661,000කින් පහත වැටුනි. එම නිසා වඩාත් පලල්ව අර්ධකාලීන වැඩකිරීමට බලකෙරීසිටින මිලියන ගනන් ජනයා ඇතුලත් කර ගන්නා විරැකියා දර්ශකය සියයට 17.3ක් කරා ඉහල නැග්ගේ ය.

27. අර්බුදය සමහර රාජ්‍යවල ද නගරවල ද අවපාත මට්ටම කරා දැනටම ලඟා වී ඇත. මිචිගන් ප්‍රාන්තයේ විරැකියාව නිලවශයෙන් සියයට 14.7කි. එම ප්‍රාන්තයේ විශාලම නගරය වූ ඩිට්‍රොයිට්හි විරැකියාව සියයට 50ක් තරම් වේ. රටේ ජනගහනය වැඩිම ප්‍රාන්තය වූ කැලිෆෝනියාවේ නිල විරැකියා මට්ටම සියයට 12.3කි. දිගුකාලීන විරැකියාව ඇමරිකානු ජන ජීවිතයේ පොදු ලක්ෂනයක් බවට පත්වෙමින් පවතී; විරැකියන්ගෙන් සියයට 40ක් ම සති 27 කට වඩා දිගු කාලයක් විරැකිව සිට ඇත. 2007 පටන් නිවාස මිල බිඳ වැටීම නිවාස සින්නවීම් රැල්ලක් ඇති කොට තිබේ. 2009 හතරවන කාර්තුව වන විට එය එක් මිලියනයක් විය. ඇමරිකානුවන් තවත් මිලියන 3කගේ නිවාස මෙම වර්ෂයේ දී නැතිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

28. ගතවූ දශකය වනාහී එක්සත් ජනපද ඉතිහාසයේ රැකියා සඳහා නරකම දශකයක් විය. ද වොෂින්ටන් පෝස්ට් පුවත්පත මෑත දී මෙසේ සටහන් කලේය:

"1999 දෙසැම්බරයේ පටන්, ගත් කල්හි, ශුද්ධ රැකියා නිර්මානය බින්දුවක් ව පැවතුනි. 1940 දක්වා ආපසු යන අන් මොනම දශකයක් වුව සියයට 20 ට අඩු රැකියා වර්ධනයක් දැක ගත්තේ නැත. එසේ ම ආර්ථික නිෂ්පාදන  වර්ධනය ද 1930න් මොබ අඩුම මට්ටම පෙන්නුම් කලේ ය."

29. ඇමරිකානු කම්කරුවන්ගේ ආදායම පහත වැටී ඇත. කුටුම්බයන්හි ශුද්ධ අගය ද වැටී ඇත. සතිපතා සාමාන්‍ය මූර්ත වැටුප 2009 දී සියයට 1කින් පහත වැටුනු අතර ශ්‍රම ඵලදායීතාවය ඉහල නැංගේ ය. *ලොස්ඇන්ජලීස් ටයිම්ස්* පුවත්පතේ ලිපියක් මෙසේ සඳහන් කරයි: "වෝල්වීදියෙන් සහ ධවල මන්දිරයෙන් වැගිරෙන විජයග්‍රහන වාදී කයිවාරුව කොතරම් වුවත්, - ද්‍රව්‍යමය වශයෙන් කිවහොත් මෙය වනාහී එක්සත් ජනපද පවුල්වලට ව්‍යසනකාරී වර්ෂයක් වූයේ ය. දෙවන ලෝක යුද්ධයෙන් පසු ප්‍රථම වතාවට, වානිජ සහ කම්කරු දෙපාර්තමේන්තුවලට අනුව සාමාන්‍ය ඇමරිකානුවකුගේ ශුද්ධ අගය "සියයට 13ක ප්‍රමානයකින් අතිමහත් ලෙස පහත වැටුනි." මෙය 1990ගනන්වල සියයට 44ක වැඩි වීමක් ද 1980 ගනන්වල සියයට 35ක වැඩිවීමක් ද 1970 ගනන්වල සියයට 12ක වැඩිවීමක් ද 1960 ගනන්වල සියයට 25ක වැඩිවීමක් ද 1950 ගනන්වල සියයට 26ක වැඩිවීමක් ද සමග සන්සන්දනය කල යුතුව ඇත.

## ඔබාමා පාලනාධිකාරය

30.තමා පත්කරගත් කම්කරුවන්ට බැරැක් ඔබාමා ලබාදුන්නේ අති මහත් අපේක්ෂා භංගයකි. ඔහු තම ජනාධිපති ව්‍යායාමයෙහි ඉදිරිපත් කල පොරොන්දු හිස් වංචනික ඒවා බව ජනයා වටහාගෙන සිටිති.  තම පිලිවෙතෙහි සෑම අංගයක දී ම ඔබාමා පාලනාධිකාරය සුපිරි ධනවතුන්ට පක්ෂපාතීභාවය තහවුරු කර ඇත. එහි ස්වදේශීය පිලිවෙත වන්නේ මූල්‍ය වංශාධිපතියන් ගලවාගෙන අර්බුදයේ මුලු බර කම්කරු පන්තිය මත පැටවීමේ තනි අරමුනයි. ලෝක පරිමානව ඒ සා විනාශකාරී ගම්‍යයන් දරා සිටි මූල්‍යමය ගිනියම්වීමේ ආරම්භයෙන් යාන්තම් අවුරුද්දක් ගතවීමට පෙර ඔබාමා සම්පාදනය කල ට්‍රිලියන ප්‍රමාන ඩොලර්වලට පින්සිදුවන්නට ඇමරිකානු මූල්‍ය වංශාධිපතියෝ පෙර කවර කලකටත් වඩා ජයට සිටිති. ඔබාමා පාලනාධිකාරය සමාගම් විධායකයන්ගේ වැටුප්වලට මොනම බරපතල සීමාවක් වත් පැනවීම ප්‍රතික්ෂේප කලේ ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වෝල්වීදියේ සමාගම්වලින් සමහර ලොකුම ඒවා 2009 අවසානයේ දී තම විධායක නිලධාරින්ට වාර්තාගත වැටුප් සහ ප්‍රසාද දීමනා ගෙවා ලූහ. ඔබාමා දැන් පරිභෝගය කප්පාදු කිරීමේ ව්‍යාපාරයකට බැස සිටී. එහෙත් ඒ කම්කරු පන්තියට පමනි. වැටුප් කැපීමේ ජාතික ව්‍යායාමය ඇරඹූ ඔබාමා පාලනාධිකාරයේ මුල් සමයේ දී ම ජෙනරල් මෝටර්ස් සහ ක්‍රයිස්ලර් සමාගම් බලෙන්ම බංකොලොත් කිරීම මගින් අරඹන ලදී. එම බංකොලොත්වීම් පාවිච්චි කරනු ලැබුවේ වෘත්තීය සමිති නායකත්වයේ සම්පූර්න සහාය ඇතිව මෝටර් කම්කරුවන් ගෙන් දරුනු ලෙස සහන කොල්ලකාගැනීමේ නව වටයක් දියත් කිරීමට ය.

31. කම්කරුවෝ තමන්ට අවශ්‍ය සමාජ ප්‍රතිසංස්කරනයන් ක්‍රියාත්මක කරවාගැනීමේ ද ප්‍රජාතන්ත්‍ර අයිතීන් පුලුල් කර ගැනීමේ ද උපකරනයක් ලෙස ෆෙඩරල් (මධ්‍යම) ආන්ඩුව සැලකීමට ගතවූ දශකයන් තුල දී පුරුදුව සිටියෝය. 1930 ගන්න්වල මහා අවපාතයට සහ පන්ති ආතතීන් වැඩී ඒමට පිලිතුරු වශයෙන් නිව් ඩීල් ප්‍රතිසංස්කරන - සමාජ රක්ෂනය ද ටෙනසී ගංගා නිම්න අධිකාරය ද නව බැංකු රෙගුලාසි ද - ජනාධිපති රූස්වෙල්ට් ක්‍රියාත්මක කලේ ය. පසුව 1960 ගනන්වල දී මධ්‍යම ආන්ඩුව සිවිල් අයිතිවාසිකම් නීති සහ මෙඩිකෙයා හා මෙඩිකේට් වැනි සෞඛ්‍ය රක්ෂන වැඩපිලිවෙලවල් ක්‍රියාත්මක කලේ ය. මෙම අවස්ථා දෙකේදී ම ධනපති පන්තිය කලේ සමාජ අර්බුදයට ද පන්ති සට්ටනය මතුවී ඒමෙන් ධනේශ්වර පද්ධතිය ගලවා ගැනීම සඳහා සකස්කරන ලද ප්‍රතිසංස්කරන වැඩ ක්‍රියාත්මක කිරීමය. මෙම ප්‍රතිසංස්කරනයන්ගේ අවසාන අතිමූලික පදනම වූයේ එක්සත් ජනපදයේ ආර්ථික ශක්තිය ය. දැන් මෙය ඇත අතීතයට අයත් දෙයකි. ගතවූ දශක හතර තිස්සේ ම එක්සත් ජනපදයේ මධ්‍යම ආන්ඩුව කම්කරු පන්තියට එරෙහි මහා ප්‍රහාරයක තුඩ ලෙස ක්‍රියාත්මක වීය. 1970 ගනන්වල ආරම්භයේ දී ජනාධිපති රිචඩ් නික්සන්ගේ පාලනාධිකාරය විසින් වැටුප් සීමා කිරීම ක්‍රියාත්මක කිරීමත් සමග මෙය ඇරඹුනි.

32. ආන්ඩුවේ ක්‍රියා එක්සත් ජනපදයේ මුලු ව්‍යුහයම ප්‍රශ්නයට භාජන කරයි. මධ්‍යම ආන්ඩුවේ සෑම උපකරනයක් ම - කොංග්‍රසය, අධිකරනය සහ විධායකය - මූල්‍ය වංශාධිපතියේ දෘඩ ග්‍රහනයට අසුව සිටිති. යුද හමුදාවට මුදල් සපයාගැනීම සහ බැංකු ගලවා ගැනීමට වොෂින්ටනය එන්න එන්නම වැඩි වන්නා වූ සම්පත් ප්‍රමානයක් කා දමයි. ඔබාමා පාලනාධිකාරය, මේ වර්ෂයේ දී අලුත්වටයකින් අයවැය හිඟයන්ට මුහුන දී සිටින ප්‍රාන්ත රාජ්‍යයන්ට ආධාර කිරීම ප්‍රතික්ෂේප කර සිටියේ ය. ප්‍රාන්ත ආන්ඩුවල පාලනයේ ඉන්නා වූ මූල්‍ය සහ මහ සංගත ප්‍රභුවේ කනිෂ්ට සහකරුවෝ සෞඛ්‍ය අධ්‍යාපනය හා අනෙකුත් අංශවල සමාජ සේවාවන් කැපීම මගින් මෙම තත්වයට ප්‍රතිචාර දක්වති. දක්ෂිනාංශික අධ්‍යාපන පිලිවෙත් ක්‍රියාත්මක කිරීම මත පදනම් වූ "රේස් ටු ද ටොප්" (මුදුනට නැගීමේ තරග) අධ්‍යාපන වැඩපිලිවෙලේ කොටසක් ලෙස සපයන ලද මුදල් ප්‍රතිපාදන වල අල්ප බවින් අවධාරනය කෙරෙන්නේ ඔබාමා පාලනාධිකාරඅයවැය හිඟය කම්කරුවන්ගේ කොඳුමත පැටවීම මගින් විසඳ ගැනීමට ප්‍රාන්ත රාජ්‍යයන්ට බල කිරීමට අධිෂ්ඨාන

කර සිටින අයුරුය. විවිධ ප්‍රාන්ත සහ ප්‍රදේශ තුල මෙම ප්‍රහාරයට එරෙහිව විරුද්ධත්වය නැගී ඒම නියත ය. රට පුරාම කම්කරුවන් පොදු අරගලයක් තුල ඒකාබද්ධ කිරීම සඳහා විප්ලවවාදී සමාජවාදී ව්‍යාපාරයක වර්ධනය විසින් මෙහෙයවනු ලබන නව දේශපාලන සංවිධාන රූපාකාරයන් ගොඩනගා ගත යුතු වේ.

33. ඔබාමා පාලනාධිකාරය විසින් ඇති කිරීමට උත්සාහ කරන ප්‍රධාන ප්‍රතිසංස්කරනයවූ සෞඛ්‍ය ආධාර කප්පාදුව විදහා දක්වන්නේ සමාජ සුබසාධන වැඩ පිලිවෙලවල් වනසා දැමීමට මූල්‍ය ප්‍රභුවට පවත්නා අධිෂ්ඨානයි. සාරභූත වශයෙන්ම ප්‍රතිගාමී වූ මෙම ආරම්භකත්වයෙහි ප්‍රාථමික අරමුන වන්නේ සහන වැඩපිලිවෙල, විශේෂයෙන්ම මෙඩිකෙයා සංරක්ෂන වැඩපිලිවෙල, සඳහා වූ රාජ්‍ය වියදම් කපා දැමීමයි. නව සෞඛ්‍ය තත්ව පරීක්ෂනයන් ද රෝග නිවාරන වැඩ පිලිවෙලවල් ද සමග සම්බන්ධව වයස්ගත ජන සංඛ්‍යාවේ වැඩීම ද ජීවිතාපේක්ෂාව ඉහල යාම ද කෙරෙහි පාලක පන්තියේ ප්‍රතිචාරය වී ඇත්තේ වඩවඩාත් පන්තිය පදනම් කරගත් සෞඛ්‍ය සේවා ක්‍රමයක් ඇති කිරීමය. බැංකුවලට ඇප දීම සඳහා මුදල් වියදම් කිරීම නිසා දැවැන්ත ලෙස උග්‍ර වී ඇති ඇමරිකා එක්සත් ජනපදයේ මූල්‍ය හිඟය විසඳලීමට යතුර ලෙස සෞඛ්‍ය සේවා කප්පාදු කිරීමට ඔබාමා යොමු වී සිටී. සැප්තැම්බරයේ දේශනයකදී ඔහු මෙසේ ප්‍රකාශ කලේ ය, "අපගේ හිඟය පිලිබඳ ගැටලුව වනාහී අපගේ සෞඛ්‍ය සේවා ගැටලුවයි. අන් කිසිවක් වත් ඊට සමීපවන්නේ නැත." මැසචුසෙට් ප්‍රාන්තයේ, ඩිමොක්‍රටික් පක්ෂය ලද පරාජයට පසු තවතවත් දකුනට ගමන්කරන ඔබාමා පාලනාධිකාරය සෞඛ්‍ය සේවා කප්පාදුව මගින් ප්‍රතිසංස්කරන පිලිබඳ ව්‍යාජය ද " යුනිවර්ෂල් කවරේජ්" (සියලුදෙනාට රක්ෂන සැපයීම) ද පවා අතහැර දමමින් වේගයෙන් දකුනට පදිමින් සිටී.,

34. මූල්‍ය වංශාධිපතිත්වය විසින් ක්‍රියාත්මක කිරීමට අධිෂ්ඨාන කරගෙන සිටින මහා සූරාකෑම සමග කම්කරු පන්තියට යහපත් සෞඛ්‍ය සේවාවන් අධ්‍යාපනය සහ සමාජ සේවාවන් සැපයීම කිසිසේත් ම ගැලපෙන්නේ නැත. ඩිමොක්‍රටික් පක්ෂයේ මූලෝපායඥයන් ගේ ඉතා බලගතු චින්තන පර්ෂදයක් වූ පීටර්සන් ආයතනයේ ප්‍රධානියා වන සී ෆ්‍රෙඩ් බර්ග්ස්ටන් ෆොරීන් එෆෙයාර්ස් සඟරාවට සැපයූ ලිපියක දී පාලක පන්තියේ සැලසුම් මෙසේ ඉදිරිපත් කරයි; මධ්‍යම ආන්ඩුවේ හිඟ පියවාගැනීමට සඳහා ඉතාමත්ම වැදගත් පියවර වන්නේ "දිගුකාලීන වෛද්‍ය වියදම් සීමා කිරීම ය. සෞඛ්‍ය සේවා ප්‍රතිසංස්කරනයේ ඒකාග්‍රිත සංරචකයක් වන එම ඉහත සඳහන් පියවර දල ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශත ඒකක කිහිපයක්ට සමාන වටිනාකමක් ඉතුරුකර දෙනු ඇත." බර්ග්ස්ටන් යෝජනා කරන තවත් පියවරවලට පහත සඳහන් දෑ ද ඇතලත් යඃ "විශ්‍රාම යන වයස අනුක්‍රමයෙන් ඉහල දැමීම සහ වැටුප්වල වැඩිවීම වෙනුවට මිල මට්ටම් වල වැඩිවීම පිලිබිඹු වන සේ සහන සූත්‍ර වෙනස් කිරීම ඇතුලත් වන පරිදි පරිපූර්න සමාජ රක්ෂන ප්‍රතිසංස්කරනය සහ අවශ්‍ය රාජ්‍ය ආදායම ඉහල යවමින් පුද්ගලික ඉතුරුකිරීම්වලට අලුත් උත්තේජකයක් සපයාදීමට පරිභෝගය මත බදු ප්‍රමානය වැඩි කිරීම."

## පන්ති අරගලයේ පුනර්ජීවනය සහ සමාජවාදී සමානතා පක්ෂයේ කර්තව්‍යයෝ

35. ලෝක ධනවාදී පද්ධතිය විප්ලවවාදී නැගීමක නව යුගයකට ඇතුල් වෙමින් පවතී. ධනවාදය දිගින්දිගට පවත්වාගෙන යාම කම්කරු පන්තිය ඉමහත් දිලිඳු බවට ඇද දමනවා පමනක් නොව මානව ශිෂ්ඨාචාරයේ මුලුමහත් අනාගතයට ම තර්ජනය කරන්නා වූ ලෝක පරිමාන අධිරාජ්‍යවාදී යුද්ධයකට ද මග පාදනු ඇත. එසේ වුව ද මෙම අර්බුදයෙන් එලියට මගක් තිබේ. සමාජවාදී විප්ලවය සඳහා වෛෂයික කොන්දේසි - තාක්ෂනික වශයෙන් ද මානව සාධකය වශයෙන් ද - පෙර කවර කලෙකටත් වඩා බෙහෙවින් සංවර්ධිතව පවතී. ගතවූ ශතවර්ෂය තුල දී සමාජය තුල කම්කරු පන්තියේ ගුරුත්වය අති මහත් ලෙස වැඩි වී ඇති අතර ජනසංනිවේදනයේ ද තාක්ෂනයේ ද විප්ලවවාදී වර්ධනය ලෝක පරිමානව ඒකාග්‍ර භාවිතාවක් සඳහා සාධක නිර්මානය කර තිබේ.

36. අර්බුදය උග්‍ර වත්වත් දේශපාලන ව්‍යුහයන්ගේ ස්නායුඝන, අසංවේදී බව වඩවඩාත් පැහැදිලිවෙයි. සම්ප්‍රදායික දේශපාලන පක්ෂ සහ සංස්ථාවෝ කම්කරු පන්තියට ධනපති ප්‍රහාරයෙන් ආරක්ෂාවීමට කුමන මාවතක් හෝ නොසපයති. එක්සත් ජනපදය තුල ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් පක්ෂ නියෝජනය කරන්නේ එකම පන්ති ආසක්තයන් ය. ඒවා ඒකාබද්ධව නිර්මානය කරන්නේ දේශපාලන හා සමාජ ප්‍රතිගාමීත්වයේ "ද්විපාක්ෂික පද්ධතියකි." විවිධ රටවල දේශපාලන සම්ප්‍රදායන්ගේ සහ ඉතිහාසයේ වෙනස්කම් පැවතුන ද ජාත්‍යන්තරව පවතින්නේ ද එම තත්වය ම ය. "ලේබර් (කම්කරු)", "සෝෂලිස්ට් (සමාජවාදී)" සහ "කොමියුනිස්ට් යනාදී වශයෙන් විවිධ පක්ෂ තවමත් අලවාගන්නා ලේබල් තවදුරටත් මොනයම්මැ ආකාරයකින් හෝ ධනවාදය කෙරෙහි සැබෑ විරුද්ධත්වයක් හෝ ප්‍රධාන දක්ෂිනාංශික ධනේශ්වර පක්ෂවලින් දේශපාලනිකව අර්ථභාරී වෙනස්කම් හෝ දරාසිටින්නේ නැත.

37. වෘත්තීය සමිති සම්බන්ධයෙන් කිවහොත් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කොමිටිය මීට 20 වසරකට පෙර කල විග්‍රහය - එනම් රැකියා සහ වැටුප් වලට එරෙහිව මහා සංගතයන්ගේ ප්‍රහාරය පරයාලීමට නම් අන් සියල්ලට වඩා කම්කරුවන් මෙම සංවිධානවලින් (වෘත්තීය සමිතිවල) විලංගුවලින් බිඳීගත යුතුය යන්න

- පරම වශයෙන්ම නිවැරදි බව ඔප්පු වී තිබේ. ඇමරිකා එක්සත් ජනපදයේ ඒඑෆ්එල්-සීඅයිඕ සංවිධානය සහ චේන්ජ් ටු වින් කෝඑලීෂන් නම් සංවිධානය "කම්කරු පන්ති සංවිධාන" නොවේ. ඒවා වනාහී රාජ්‍යයේ අමතර උපකරනයන් ය, කම්කරු පන්තිය සූරාකෑමේ ලා යෙදෙන ද්විතීයක උපකරනයන් ය. ඒවායේ සභාපතිත්වය දරන ඉහල මධ්‍යම පන්තික විධායකයන් වනාහී ලේබර් මූමන්ට් (කම්කරු ව්‍යාපාරය) ජාවාරමක් හෙවත් තමන්ගේ පෞද්ගලික ධනය වැඩි කිරීමේ උපක්‍රමයක් කර ගත් එවුන් ය. මෙයින් එකදු සංවිධානයක් වත් දශක තුනක් පුරාම මොනම අර්ථභාරී අරගලයකවත් යෙදී නැත. ඔවුන් තමන්ගේ ප්‍රධාන ම වගකීම ලෙස ගන්නේ කම්කරුවන්ගෙන් පාලකයින්ට සහන උදුරා දීම ද එයට හිලව් වශයෙන් වෘත්තීය සමිති විධායකයන්ට කාසි පොදි ලබාගැනීම ද වේ. මීට උදාහරනයක් නම් ඇමරිකාවේ යූඒඩබ්ලිව් (එක්සත් මෝටර් කම්කරු) සංවිධානයේ වීබා ක්‍රියාමාර්ගයයි.

38. වත්මන්හි දේශපාලන ස්ථාවරත්වයක් පවතින්නේ ය යන රැවටිලිකාරී ස්වරූපයක් පවතින්නේ මහා ජන විරෝධතා ප්‍රකාශනය කරන්නා වූ සංවිධාන රූපාකාරයන් නොපවත්නා තතු තුලය. එහෙත් මතුපිටට යටින් මහජන අතෘප්තිය නිරතුරුව වැඩෙමින් එලියට පැනීමට මාන බලයි. මෙම විරුද්ධත්වය, නිල දේශපාලන ජීවිතයේ වත්මන් අපකීර්තියට පත් රාමුව බිඳගෙන පුපුරා යන තත්වය ලඟාවෙමින් පවතී. එය ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් පක්ෂ, ඔබාමාපාලනාධිකාරය, වෘත්තීය සමිති සහ ධනේශ්වර පද්ධතිය සමග සෘජු ගැටුමක් තුලින් වර්ධනය වනු නොඅනුමානය. සමාජවාදී සමානතා පක්ෂය අලුත් වූ ද ස්වාධීන වූ ද මහජන අරගලයෝ සංවිධානයන් නිර්මානය කිරීමට තමන්ගේ සම්පූර්න ශක්තිය යොදා, ඒවායේ ක්‍රියාමාර්ගය සහ උපායන් වර්ධනය කිරීමට ධෛර්යය දෙනු ඇත. ගැඹුරුවන්නා වූ සමාජ අර්බුදය ගනන් නැති අරගලයන් ද මහජන ප්‍රතිවිරුද්ධයේ විවිධ රූපාකාරයන්ද පන ගන්වනු ඇත. එහෙත් තීරනාත්මක ප්‍රශ්නය වන්නේ විප්ලවවාදී නායකත්වය පිලිබඳ ප්‍රශ්නයයි. කම්කරු පන්තියේ ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරයක් සංවිධානය කිරීමේ ද කම්කරුවන්ගේ සහ තරුනයන්ගේ නව පරපුරක් මාක්ස්වාදයේ ඉදිරිදර්ශනයෙන් සහ ඉතිහාසයෙන් උගන්වා ගැනීමේ ද කර්තව්‍ය පැටවෙන්නේ සමාජවාදී සමානතා පක්ෂය සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ සහෝදර පක්ෂයන්ගේ කර මතට ය.

© www.wsws.org